# හිනා මනා

## දෙදෙනාම දක්ෂයෝ

මයික්‍රොසොෆ්ට් ආයතනයට අලෙවි විධායක වරයන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් කැඳවා තිබිණ. මේ සඳහා දෙදහසක් පමණ දෙනා පැමිණ සිටි නිසා සියළුම දෙනා එක් ශාලාවකට ගෙන්වීමට ආයතන ප්‍රධානියා කටයුතු කළේය. ''අපගේ ආයතනය ගැන විශ්වාසය තබා මෙහි පැමිණීම ගැන මා ඔබට ස්තූතිවන්ත වෙනවා ඒ වුනාට කියන්න කණගාටුයි මට සේවය සඳහා තොරාගන්නට පුළුවන් වන්නේ දෙදෙනෙක් පමණයි'' ආයතන ප්‍රධානියා කීය. ''හොදයි මෙතනින් වින්ඩෝස් 10 හසුරුවන්නට දන්න අය ඉතිරි වෙද්දී අනිත් අය පිටත්ව යන්න.'' යලිත් ආයතන ප්‍රධානියා කීය. ශාලාවේ සිටි 2000ක් පමණ අයගෙන් 1000ක් පමණ වින්ඩෝස් 10 නොදන්න හෙයින් පිටත්ව ගියහ. මෙයට සහභාගී වූ සිරිපාල වින්ඩෝස් 10 ගැන අවබෝධයක් නැතත් එහිම රැඳී සිටියේය. ඊලඟට ප්‍රධානියා කීවේ ජාවා ගැන දන්නා අය ඉතිරි වෙද්දී අනෙක් අයට පිටත්ව යන ලෙසයි. ඉන් පසු ඉතිරි වූවේ සියයක් පමණ සංඛ්‍යාවකි. සිරිපාල ජාවා දන්නේ නැති නමුත් ඔන්න ඔහෙ ඉන්නවා යැයි හිතාගෙන නොගොස් සිටියේ ය. ඊළඟට ප්‍රධානියා මෙතැනින්  හීබ්‍රෑ භාෂාව දන්නා අය ඉතිරිවෙද්දී අනෙක් අයට පිටත්ව යන ලෙස කීවේය. සිරිපාල හීබ්‍රෑ භාෂාව නොදත් නමුත් ඔන්න ඔහෙ තව ටිකක් ඉන්නවා යැයි සිතා ගත්තේය. සිරිපාල හා තවත් එක් අයෙක් පමණ ක් ඉතිරිව ඇති බැව් සිරිපාලට තේරුම් ගියේ ''දැන් ඔය දෙදෙනාම එක ළඟට එන්න යැයි ආයතන ප්‍රධානියා කී විටය. දෙදෙනාම එක ලඟ අසුන් දෙකකට ආවෝය. දැන් මම කැමතියි ඔය දෙන්න හීබ්‍රෑ භාෂාවෙන් කතා කරනව දකින්න ආයතන ප්‍රධානියා කීවේය. අන්දුන් කුන්දුන් වූ සරිපාල අනෙකාගෙන් සිංහලෙන් ''කොහොමද මචං'' යැයි ඇසීය. අනෙකාද හිනා වෙමින් ''අඩෝ උබත් ලංකාවෙ එකෙක්'' යැයි කීවේය. සිංහල නොදත් ආයතන ප්‍රධානියා තමාට සුදුසු පුද්ගලයින් දෙදෙනෙක් සොයා ගැනීමට ලැබීම ගැන සතුටු විය.

## ටක්කෙටම උස හොයන හැටි

වායු ගෝලීය පීඩනය මනින බැරෝ මීටරය මගින් තට්ටු ගොඩනැගිල්ලක උස සොයන අයුරු පැහැදිලි කරන්න යන පැනයට ශිෂ්‍යාවක් මෙසේ ලියා තිබිණ, පළමුව බැරෝ මීටරය දිගු නූලක ගැටගසා එය ගොඩනැගිල්ල මුදුනේ සිට පහලට හෙමින් එවන්න. එය බිම නොගෑවෙන විට නැවතත් ඉහළට ඇද නූලේ දිග මැන ගැනීමෙන් ගොඩනැගිල්ලේ උස සොයාගත හැක.

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

Cartoon By SHANIKA SOMATILAKE




# යතිවර හමුව

## සෝමසිරි දෙනගම

ශ්‍රී දළදා සමිඳුන් වැඩ සිටින මහනුවර නගරයෙන් කටුගස්තොට නගරය වෙතට දිවෙන ප්‍රධාන මාවතේ කිලෝමීටර දෙකක් පමණ කටුගස්තොට දෙසට යන විට නෙත සිත බැඳලන අති සුන්දර විහාරස්ථානයක් හමුවේ. එය නමින් මාවිල්මඩ ධර්මධූත විහාරස්ථානයයි. මෙම විහාරස්ථානයේ දැනට
විහාරාධිපති ලෙස වැඩ සිටින්නේ පින්වත් දොරගමුවේ රතනසාර සමිඳුන්ය. විහාරස්ථානය හා ඉදිරි වැඩ කටයුතු ගැන උන් වහන්සේ මෙසේ අදහස් දැක්වූහ.
මා උපත ලැබුවේ 1980 ඔක්තෝබර් 9 දින දොරගමුව නම් සොඳුරු ගම්මානයේ 1998 මැයි 08 වැනි දින වත්තේගම විද්‍යාදර්ශන පිරිවෙනෙහි.
පරිවේනාධිපතිව වැඩ සිටි අරගම පුණ්‍යසාර හිමියන්ගෙන් මා පැවිද්ද ලබා ගත්තා. ඒ විතරක් නෙවෙයි පුණ්‍යසාර හිමියන්ගේ එකම ගෝල හිමි නම උනෙත් මම. මහනුවර ධර්මරාජ පිරිවෙනේ මූලික අධ්‍යාපනයත් වත්තේගම විද්‍යාදර්ශන පිරිවෙනෙන් ධර්මඥාණය ලැබූ මම උසස් අධ්‍යාපනය සඳහා විද්‍යාලංකාර පිරිවෙනට ඇතුලු වුණා. මේ වකවානුවේ අපේ ලොකු හාමුදුරුවෝ දැඩි ලෙස ගිලන් වුණ නිසා උන්වහන්සේට ඇප උපස්ථාන කිරීමට අධ්‍යාපන කටයුතු පසෙක තබා මා පැමිණියා.

තම ලොකු හාමුදුරුවන්ට ඉමහත් ගෞරවයෙන් ඕනෑකමින් හා සෙනෙහසින් ඇප උපස්ථාන කරන අප සමිඳුන් බෞද්ධ හා අන්‍යාගමිකයින්ගේ මහත් ප්‍රශංසාවට හා ගෞරවයට පාත්‍ර විය. 2011 අප්‍රේල් 02 දින ලොකු හාමුදුරුවන් අපවත් වූ අතර එතැන් සිට විහාරාධිපති ධූරයට රතනසාර හිමියෝ පත් වූ සේක.

2001 විද්‍යාලංකාර පිරිවෙනෙන් අස් වුවද ලද හැම විටෙකම දහම් පොතපත කියැවීමෙන් ධර්ම සාකච්ඡා කිරීමෙන් නාවිමනේ අරියධම්ම හිමි ළඟ වැඩ සිටිමින් භාවනා කිරීමෙන් ගොඩ නඟා ගත් ධර්ම ඥානය පාදක කර ගෙන සිය දායක පිරිස වෙත දුන්
සුපැහැදිලි ධර්මදානය හේතුවෙන් අසීමිතව පැහැදුන දායක පිරිස හිමි වටා රොක් වූහ. ඔවුන්ගේ නොමසුරු උදව් උපකාර ඇතිව ගොඩනැගූ ධර්ම දුත විහාරස්ථානය යන එන ඕනෑම අයෙකුගේ නෙත් සිත් ශාන්තියට පත් කරවන්නේය. බෞද්ධයා, විදුල රූපවාහිනී සේවාවන්වලට ද, බෞද්ධයා ගුවන් විදුලිය මහනුවර සේවය ආදී ස්ථාන සඳහා සහ වෙනත් ධර්ම දේශනා ආදිය නිසා ඉතා අවිවේකී දිවියක් අප සමිඳුන් ගත කලත් තම විහාරස්ථානයට පැමිණෙන ඕනෑම සැදැහැවතෙක්
සඳහාද උන් වහන්සේ කිසිදු පැකිලීමකින් තොරව දහම් දෙසන්නේ ඔවුනට නිවනේ මාර්ගය පැහැදිලි කර දීමටය.

දායක කාරකාදීන්ගේ උදව්වෙන් ගත් සුන්දර අඹ වනයක අඹ ගස් යට භාවනා කිරීම සඳහා භාවනා කුටි ඉදි කිරීම සඳහා අප සමිඳුන් තවත් පියවරක් ගෙන ඇත්තේ ඉතා කලාතුරකින් ලැබෙන මනුෂ්‍ය ආත්ම භවයේ දී සැදැහැවතුන් සසරෙන් එතෙර කිරීමේ උදාර බලාපොරොත්තුවෙනි. ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවක උන්වහන්සේ බැහැදැකීමට ඔබටත් මින් ආරාධනය කෙරේ.

**දුරකථන: +94 812 223 780**



**පූජ්‍ය දොරගමුවේ රතනසාර හිමි.**